**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:.30/2026**

මගේ අංකය:NP/07/10/01/237
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2026.09.21

ප්‍රධාන ලේකම්
ආණ්ඩුකාරවර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
දෙපාතර්මේන්තු ප්‍රධානීන්
උතුරු පළාත

## උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026

අමාත්‍ය මණ්ඩල කායර්ාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/04/01/Recruitment/2025 දරණ 2025.08.04 දිනැති ලිපිය, 2026.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි 2026.07.20 දින උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව, අංක NP/04/01/BMT App/2026 දරණ 2026.07.30 දිනැති ලිපිය මගින් උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම සහ සමාංක දරණ 2026.08.11 දිනැති ලිපිය මගින් ලබා දී ඇති දත්ත යනාදියට අනුව උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරට **I වන උපලේඛනයෙහි** සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන සීමිත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 ඔක්තෝබර්** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.10.09** වේ.

- **උපලේඛනය - I**

| **අනු අංකය** | **තනතුරු නාමය** | **තනතුරු අංකය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| 01. | ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී **III ශ්‍රේණිය** | a | 03 |
| 02. | ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී **පුහුණු ශ්‍රේණිය (එක් වසරකි)** | b | |

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1 (a) 2016.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී** තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, පළාත් මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කායර් පරිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් **I වන උපලේඛනයෙහි** සඳහන් **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

(b) මෙම විභාගයෙන් සමත්වන අපේක්ෂකයන් පත්වීම් දිනයේ සිට වසරක කාලයක් වැඩ බැලීමේ කාලසීමාවට යටත්ව සේවයේ යොදවනු ලබන අතර, ඉන් අනතුරුව **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී III ශ්‍රේණියේ තනතුරෙහි** ස්ථිර කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරේ III ශ්‍රේණියට** පත් වූ දින සිට වසර **තුනක් (03)** ඇතුළත පළමු වන කායර්ක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02.2 (a) **කෙසේ වුවද,** සීමිත තරඟ විභාගය මගින් **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී** තනතුරේ III **ශ්‍රේණියට** සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවේ දී, **ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පමණක් පුහුණු ශ්‍රේණියේ අදාළ** සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගෙන් සම්පූණර් කරනු ලැබේ.

(b) එවැනි අවස්ථාවකදී, තරඟ විභාගයක් මගින් පුහුණු ශ්‍රේණියේ (එක් වසරක) පත්වීමක් සඳහා තෝරාගත් අපේක්ෂකයින් **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී** පුහුණු ශ්‍රේණියට (එක් වසරක) පත් කරනු ලැබේ.

(c) නියමිත පුහුණු කාලසීමාව අවසන් වූ පසු, මෙම අභ්‍යාසලාභීන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන සුදුසුකම් ලැබීමේ විභාගයකට (ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ යන දෙකම ඇතුළත්) පෙනී සිටිය යුතුය.

(d) එම විභාගය සමත් වීමෙන් පසු, සමත් වූ බව සනාථ කරමින් අදාළ ආයතනය විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මෙම තනතුරේ III ශ්‍රේණියට අදාළ පත්වීම ලබා දෙනු ලැබේ.

(e) ඉහත 2.2 (c) ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි, පුහුණු කාලසීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීසර් කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීසර් කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගයෙන් අසමත්වන, සීමිත තරඟ විභාගය මගින් බඳවාගත් ආධුනිකයන්ගේ මෙම පුහුණුව සඳහා ලබාදුන් පත්වීම අවලංගු කරනු ලබන අතර, ඔහු/ඇය කලින් දැරූ තනතුරට පෙරළා යවනු ලැබේ.

02.3 සීමිත තරඟ විභාගය මගින් තෝරාගනු ලබන ආධුනිකයන්, පුහුණු ශ්‍රේණියට පත් කිරීමේ දී පෙර තනතුරේ ලැබූ වැටුප් පරිමාණයේ පිහිටවනු ලැබේ. කෙසේ වෙතත්, පුහුණු කාලසීමාව අවසානයේ දෙපාතර්මේන්තුව මගින් පවත්වනු ලබන විභාගය සමත් වන තෙක් ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ මූලික වැටුප් වධර්කයට

සමාන වාෂරීක දීමනාවක් ගෙවනු ලැබේ. ඉන්පසු, එම විභාගය සමත් වීමෙන් අනතුරුව මෙම දීමනාව නොකඩවා ගෙවනු ලැබේ.

පුහුණු කාලසීමාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියට අනුකූලව වැටුප සංශෝධනය කරනු ලැබේ. (02.03.2000 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2000 මගින් සංශෝධිත)

02.4 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.6 සීමිත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ සම්පූර්ණ එකතුව **I වන උපලේඛනයෙහි** සඳහන් පරිදි **තුනකි (03).** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය

### 03.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරේ III වන ශ්‍රේණිය සඳහා:-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **10/2025** ප්‍රකාර **MN 3 - 2025** වැටුප් කේතය අනුව **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී** තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.52,250 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 10 X 1,350 = රු.100,040/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

### 03.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරේ පුහුණු ශ්‍රේණිය සඳහා:-

උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී** තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියෙහි නියම කර ඇති 2025.03.25 දිනැති අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව, **VI වන උපලේඛනයෙහි** නියම කර ඇති පරිදි පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා දීමනාව ලෙස රු.**43,274/-ක** මාසික දීමනාවක් 2026 වෂර්යට අදාළව ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම්

### 04.1 ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී තනතුරේ III වන ශ්‍රේණිය

#### 04.1.1 අධ්‍යාපන සුදුසුකම්:

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා **සම්මාන සාමාර්ථ සහිතව** (Credit Pass) **දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හය (06) කින්** සමත්ව තිබිය යුතුය.

**04.1.2 වෘත්තීය සුදුසුකම්:**

පහත සඳහන් **එක් වෘත්තීය සුදුසුකමක් සමග** අදාළ ක්ෂේත්‍රයේ **වසර පහ (05) ක** පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් තනතුර හා සම්බන්ධ ක්ෂේත්‍රයට (ජීව වෛද්‍ය - Bio-Medical / විදුලි - Electrical / ඉලෙක්ට්‍රොනික් - Electronic) අදාළව ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවක් (National Diploma in Technology) ලබා තිබිය යුතුය.

**නැතහොත්**

(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්ෂණික විද්‍යාලයකින් (Technical College), ආයතනයකින් තනතුර හා සම්බන්ධ ක්ෂේත්‍රයට (ජීව වෛද්‍ය - Bio-Medical / විදුලි - Electrical / ඉලෙක්ට්‍රොනික් - Electronic) අදාළව ජාතික වෘත්තීය කුසලතා 06 වන මට්ටමේ (NVQ Level - 06) සහතිකයක් ලබා තිබිය යුතුය.

**නැතහොත්**

(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ වෙනත් අදාළ සහතික කිරීමේ ආයතනවල අදහස් හා නිරීක්ෂණ මත පදනම්ව ඉහත 04.1.2 (ii) හි සඳහන් සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**04.1.3 සේවා පළපුරුද්ද:**

උතුරු පළාත් රාජ්‍ය සේවයේ, ප්‍රාථමික මට්ටමේ (Primary Level) / කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ (Management Assistant Non-Technical Segment 02 Category) / කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ (Management Assistant Non-Technical Multi Functional Segment 01 Category) ස්ථිර තනතුරක **වසර පහ (05) ක** සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

## 04.2 ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී පුහුණු ශ්‍රේණිය (එක් වසරකි)

**a) අධ්‍යාපන සුදුසුකම්:**

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා **සම්මාන සාමාර්ථ සහිතව** (Credit Pass) **දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හය (06) කින්** සමත්ව තිබිය යුතුය.

**b) වෘත්තීය සුදුසුකම්:**

පහත සඳහන් **එක් වෘත්තීය සුදුසුකමක් සමග** අදාළ ක්ෂේත්‍රයේ **වසර පහ (03) ක** පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(i) තාක්ෂණික විද්‍යාලය (Technical College) / තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් ආයතනයකින් තනතුර හා සම්බන්ධ ක්ෂේත්‍රයට (ජීව වෛද්‍ය - Bio-Medical / විදුලි - Electrical / ඉලෙක්ට්‍රොනික් - Electronic) අදාළව ජාතික තාක්ෂණික සහතිකය (National Certificate in Technology) / ජාතික වෘත්තීය කුසලතා 04 වන මට්ටමේ (NVQ Level - 04) සහතිකයක් ලබා තිබිය යුතුය.

**නැතහොත්**

(ii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ වෙනත් අදාළ සහතික කිරීමේ ආයතන වැනි ආයතනවල අදහස් හා නිරීක්ෂණ මත පදනම්ව ඉහත 04.2 (b) (i) හි සඳහන් සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**c) සේවා පළපුරුද්ද:**

උතුරු පළාත් රාජ්‍ය සේවයේ, ප්‍රාථමික මට්ටමේ (Primary Level) / කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ (Management Assistant Non-Technical Segment 02 Category) / කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ (Management Assistant Non-Technical Multi Functional Segment 01 Category) ස්ථිර තනතුරක **වසර පහ (05) ක** සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**සටහන:**

I. III ශ්‍රේණියට සෘජුවම බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රමවේද ද්විත්වයෙන්ම බඳවා ගැනීම සිදු කෙරේ. නමුත් III ශ්‍රේණියට මුලින්ම බඳවා ගැනීම සිදුකළ යුතුය.

II. III ශ්‍රේණියට සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවේ දී, **ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පමණක් පුහුණු ශ්‍රේණියේ අදාළ** සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

## 04.3 ශාරීරික යෝග්‍යතාවය:

අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමට හැකි වන පරිදි මනා **ශාරීරික, මානසික යෝග්‍යතාවයකින් යුතු විය යුතුය.**

## 04.4 වෙනත් සුදුසුකම්:

i. ස්ථිර තනතුරක සේවය ස්ථිර කර තිබිය යුතුය.

ii. අයදුම්කරු, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර, රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ බව දෙපාතර්මේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට, නිලධාරීන් සියලුම සුදුසුකම් පූර්ණ වශයෙන් සම්පූර්ණ කර ඇත්නම් පමණක් ඔහු/ඇය බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබුවෙකු ලෙස සළකනු ලැබේ.

## 05. බඳවා ගැනීමේ පරිපාටිය

05.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, ඉල්ලා ඇති **සුදුසුකම් සියල්ල** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතු අතර, ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සියල්ලම පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.2 ලිඛිත පරීක්ෂණය මගින් සහ කුසලතා පදනම මත බඳවා ගැනීමේ අවස්ථාවේ බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවාගැනීමේ පරිපාටිය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව, **ජීව වෛද්‍ය තාක්ෂණ ශිල්පී III වන ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ. මෙම දැන්වීමේ සඳහන් කර ඇති සුදුසුකම් සියල්ල සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මෙම දැන්වීමේ සඳහන් කර ඇති සියලුම සුදුසුකම් සහ සුදුසුකම් සනාථ කෙරෙන ලිපිලේඛන පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

05.3 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතරින්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

## 06. විභාග ගාස්තුව

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත** යන නමට **යාපනය තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 07. අයදුම්කිරීමේ පිළිවෙල

07.1 මෙම නිවේදනය සමග නිකුත් කර ඇති අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් නිල වෙබ් අඩවියට පිවිස බාගත කරගෙන සම්පූර්ණ කළ අයදුම්පත, **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

07.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/237"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

07.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

07.5 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපෑල - **examppscnp@gmail.com)**

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

08.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාතර්මේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ"** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසි උල්ලංඝණය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

08.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 09. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 10. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්ය වේ. අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය.

## 11. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් **ප්‍රශ්න පත්‍ර 02 න්** සමන්විත වන අතර, මෙම විභාගය සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් නොවූ කිසිදු අයදුම්කරුවෙකුට ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීම වෙනුවෙන් අයදුම් කිරීමේ හැකියාවක් නොමැත.

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තගර්තය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය (Intelligence Test) | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ සිතීමේ තකර්ානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.<br>This paper consists of questions designed to assess the candidate's capacity for critical reasoning decision making and analytical power. | පැය 01 යි | 100 |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (Subject related Technological Test) | ජීව වෛද්‍ය උපකරණ පිළිබඳ දැනුම (Knowledge on Bio Medical Equipment), විදුලි (Electric) / විද්‍යුත් පරිපථ (Electronic Circuits), විදුලිය (Electrical) / විද්‍යුත් රෙගුලාසි (Electronic Regulations), ශාක පිළිබඳ දැනුම (Knowledge of Plants) | පැය 03 යි | 100 |

**<u>සටහන</u>**

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් **අවම වශයෙන් සියයට හතළිහක් 40%** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල

අයදුම්කරුවන්ගේ සම්පූණර් විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**සැළකිය යුතුය:-**

(i). මෙම විභාග දැන්වීම මගින් විධිවිධාන සලසා නොමැති මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූණර් බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk ⟶ **Exams and Recruitments** ⟶ **Advertisement** ⟶ **2026** උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

(vi). මෙම චක්‍රලේඛය ඔබ අමාත්‍යාංශය/දෙපාතර්මේන්තුව/කායර්ාලය යටතේ සේවය කරනු ලබන සුදුසුකම් සහිත සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමුකරන්න.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2026.09.21